සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ගිණුම්කරණය I
கணக்கீடு I
Accounting I

33 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலங்கள்
Two hours

විභාග අංකය : ...............................

උපදෙස්:

- ✻ අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- ✻ අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
- ✻ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.
- ✻ **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති / ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

1. ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ,
   (1) ආයතනයක සියලු ම ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීම ය.
   (2) ආයතනයක ගනුදෙනු සටහන් කිරීම, වර්ගකිරීම සහ සාරාංශ කිරීම ය.
   (3) ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කර ඇති තොරතුරු විශ්ලේෂණය කිරීම ය.
   (4) ආයතනයක ගනුදෙනුවල සවිස්තරාත්මක විශ්ලේෂණයක් එහි කළමනාකරුවන්ට සැපයීම ය.
   (5) ආයතනයක් පිළිබඳ තොරතුරු, එහි තොරතුරු භාවිත කරන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා සැපයීම ය.
   (.........)

2. පහත දක්වෙන කුමන ගනුදෙනුව ආයතනයක ගැනුම් ජර්නලයෙහි සටහන් කරනු ලබයි ද?
   (1) ණයට මිල දී ගන්නා ලද සියලු ම වත්කම්
   (2) විකිණීමේ පරමාර්ථයෙන් කරන ලද සියලු ම ගැනුම්
   (3) විකිණීමේ පරමාර්ථයෙන් කරන ලද සියලු ම ණයට ගැනුම්
   (4) ණයට විකිණීමේ පරමාර්ථයෙන් කරන ලද සියලු ම ගැනුම්
   (5) ණයට මිල දී ගන්නා ලද සියලු ම දේපල, පිරියත සහ උපකරණ
   (.........)

3. ව්‍යාපාරයක් රු. 500 000 ක් වටිනා භාණ්ඩ ණයට විකිණීය. පිරිවිතරවලට එකඟ නොවන්නේයැයි දක්වා ගනුදෙනුකරුවෝ මෙයින් රු. 50 000 ක් වටිනා භාණ්ඩ හරවා එවූහ. පසුව ගනුදෙනුකරුවෝ මුදල් ගෙවා ඉතිරි ශේෂය පියවූහ. මෙම ගනුදෙනු සටහන් කිරීමට භාවිත කරන මූලාශ්‍ර ලියවිලිවල අනුපිළිවෙළ වන්නේ,
   (1) ඉන්වොයිසිය, හරපත සහ ගෙවීම් වවුචරය
   (2) ඉන්වොයිසිය, බැරපත සහ ගෙවීම් වවුචරය
   (3) ඉන්වොයිසිය, ජර්නල් වවුචරය සහ ලදුපත
   (4) ඉන්වොයිසිය, හරපත සහ ලදුපත
   (5) ඉන්වොයිසිය, බැරපත සහ ලදුපත
   (.........)

4. ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ පහත කාර්යවල නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?
   A - මූලික පොත්වල සටහන් තැබීම.
   B - මූලාශ්‍ර ලියවිලි පිළියෙල කිරීම.
   C - ව්‍යාපාර ගනුදෙනු සිදුවීම.
   D - ශේෂ පිරික්සුම පිළියෙල කිරීම.
   E - ලෙජරයට ගනුදෙනු පිටපත් කිරීම.
   (1) B, D, C, A, E
   (2) C, B, A, E, D
   (3) C, B, A, D, E
   (4) C, A, B, E, D
   (5) D, B, C, A, E
   (.........)

5. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශනවලට පදනම් වන උපකල්පන දෙක කුමක් ද?
   (1) ඒකක සහ උපචිත
   (2) ඒකක සහ අඛණ්ඩ පැවැත්ම
   (3) ඒකක සහ කාලච්ඡේද
   (4) උපචිත සහ අඛණ්ඩ පැවැත්ම
   (5) කාලච්ඡේද සහ මූල්‍ය මිනුම්
   (.........)

6. විකුණූ භාණ්ඩවල පිරිවැය, වියදමක් ලෙස ද වර්ෂය අග තොග, වත්කමක් ලෙස ද හඳුනාගැනීම වඩාත් හොඳින් විස්තර කරනුයේ පහත දක්වෙන කුමන ගිණුම්කරණ සංකල්පය ද?
   (1) අඛණ්ඩ පැවැත්ම
   (2) ඓතිහාසික පිරිවැය
   (3) ගැළපුම්
   (4) ආරක්ෂණ
   (5) උපලබ්ධි
   (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com www.artsapi.lk

7. සමාගමක් විසින් අවුරුදු 10 කට පෙර ඉඩමක් මිල දී ගත් අතර දනට එහි සාධාරණ අගය ගැනුම් මිල මෙන් 5 ගුණයක් වේ. මෙම ඉඩම එහි සාධාරණ අගයට ප්‍රත්‍යාගණනය කළේ නම්, පහත සඳහන් ගිණුම්කරණ තොරතුරුවල කුමන ගුණාත්මක ගති ලක්ෂණය එයින් නිරූපණය කෙරේ ද?
   (1) සැසඳිය හැකි බව (2) අදාළ බව (3) විශ්වසනීය බව
   (4) යථාරූපී බව (5) තේරුම් ගත හැකි බව (.........)

8. ආයතනයක් විසින් යන්ත්‍රයක් නඩත්තු කිරීම සඳහා රු. 8 000 ක් ගෙවන ලදී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්වන්නේ,
   (1) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් වගකීම් අඩුවීම ලෙස ය.
   (2) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් වගකීම් වැඩිවීම ලෙස ය.
   (3) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් හිමිකම අඩුවීම ලෙස ය.
   (4) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් හිමිකම වැඩිවීම ලෙස ය.
   (5) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් වත්කම් වැඩිවීම ලෙස ය. (.........)

9. වර්ෂයක් තුළ දී තනි ව්‍යාපාරිකයකුගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු. 500 000 කින් වැඩි විය. පහත සඳහන් කුමන ගනුදෙනුව මෙම වැඩිවීම පෙන්නුම් **නොකෙරේ ද?**
   (1) ව්‍යාපාරය රු. 500 000 ක ලාභයක් ඉපැයීම.
   (2) අයිතිකරු රු. 500 000 ක් නව ප්‍රාග්ධනය ලෙස හඳුන්වා දීම.
   (3) ව්‍යාපාරයේ භාවිතය සඳහා අයිතිකරු ඔහුගේ රු. 500 000 ක් වටිනා මෝටර් වාහනයක් ගෙන ඒම.
   (4) අයිතිකරු ව්‍යාපාරයේ බැංකු ගිණුමෙන් ඔහුගේ පෞද්ගලික ණයක් වන රු. 500 000 ක් ගෙවීම.
   (5) ව්‍යාපාරයේ සැපයුම්කරුවකුට ගෙවිය යුතු රු. 500 000 ක් අයිතිකරුගේ පෞද්ගලික බැංකු ගිණුමෙන් ගෙවීම. (.........)

10. ආයතනයක් එහි සියලු ම මුදල් ගනුදෙනු බැංකු ගිණුමක් ආශ්‍රයෙන් පවත්වාගෙන යයි. 2012.01.31 දිනට එහි මාසික බැංකු ප්‍රකාශනයෙහි රු. 270 000 ක බැර ශේෂයක්, පෙන්නුම් කරන ලදී. මෙදිනට බැංකුවෙහි තැන්පත් කළමුත් උපලබ්ධි නොවූ චෙක්පත් සහ නිකුත් කළමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් අනුපිළිවෙළින් රු. 85 000 ක් සහ රු. 45 000 ක් විය. 2012.01.31 දිනට ආයතනයේ පොත්වල බැංකු ශේෂය (හර),
   (1) රු. 225 000 (2) රු. 230 000 (3) රු. 270 000
   (4) රු. 310 000 (5) රු. 355 000 (.........)

11. ව්‍යාපාරික ආයතනයක කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමෙන් පසු පහත දක්වෙන වැරදි අනාවරණය විය.
   (i) ණයගැතියකුගෙන් ලද රු. 18 500 ක මුදලක් රු. 15 800 ක් ලෙස ණයගැති ගිණුමෙහි සටහන් වී ඇත.
   (ii) ණයට විකුණුම් රු. 25 000 ක් රු. 2 500 ක් ලෙස විකුණුම් ගිණුමට බැර කර ඇත.
   (iii) ආපසු එවුම් රු. 3 000 ක් විකුණුම් ගිණුමට හර කර ඇත.

   මෙම වැරදි නිසා ආයතනයේ ලාභය අවතක්සේරු වී ඇත්තේ,
   (1) රු. 18 500 කින් ය. (2) රු. 22 500 කින් ය. (3) රු. 25 200 කින් ය.
   (4) රු. 25 500 කින් ය. (5) රු. 28 200 කින් ය. (.........)

12. තොග අයිතම තුනක් සඳහා 2012.03.31 දිනට පහත සඳහන් තොරතුරු සමාගමක් විසින් සපයා ඇත.

| අයිතම | නිෂ්පාදන පිරිවැය (රු.) | අපේක්ෂිත විකුණුම් ආදායම (රු.) | අපේක්ෂිත විකුණුම් වියදම (රු.) |
|---|---|---|---|
| A | 13 000 | 15 000 | 5 000 |
| B | 10 000 | 16 000 | 4 000 |
| C | 17 000 | 19 000 | 7 000 |

   අයිතම ක්‍රමය අනුව 2012.03.31 දිනට තොගයේ වටිනාකම කුමක් ද?
   (1) රු. 32 000 (2) රු. 34 000 (3) රු. 40 000
   (4) රු. 42 000 (5) රු. 50 000 (.........)

- **ප්‍රශ්න අංක 13 සහ 14 ට පිළිතුරු සැපයීම සඳහා ව්‍යාපාර ආයතනයකට අදාළ පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

(i) වැටුප්:

| | රු. |
|---|---|
| 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී ගෙවන ලද | 44 000 |
| ගෙවිය යුතු - 2011.03.31 දිනට | 4 000 |
| - 2012.03.31 දිනට | 24 000 |

(ii) කුලී ආදායම:
   2011.10.01 දින කුලියට දුන් ගොඩනැගිල්ලක් සඳහා 2012.06.30 දිනෙන් අවසන් මාස 9 සඳහා රු. 90 000 ක කුලියක් ලැබුණි.

13. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කළ යුතු වැටුප් සහ කුලී ආදායම කොපමණ ද?

| | වැටුප් (රු.) | කුලී ආදායම (රු.) |
|---|---|---|
| (1) | 24 000 | 30 000 |
| (2) | 28 000 | 30 000 |
| (3) | 44 000 | 60 000 |
| (4) | 64 000 | 60 000 |
| (5) | 64 000 | 90 000 |

(.........)

www.pastpaperlk.com www.artsapi.lk

14. 2012.03.31 දිනට ශේෂ පත්‍රයෙහි ඉහත ගනුදෙනුවලට අදාළව හඳුනාගත යුතු මුළු වගකීම් කොපමණ ද?
(1) රු. 20 000 (2) රු. 24 000 (3) රු. 30 000
(4) රු. 54 000 (5) රු. 60 000 (.........)

● ප්‍රශ්න අංක 15 සහ 16 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.

2011.04.01 දින අමිල සහ කපිල හවුල් ව්‍යාපාරයකට එළඹුන අතර පහත සඳහන් එකඟතා ඇතිකර ගත්හ.
(අ) එක් හවුල්කරුවකුට රු. 100 000 ක වාර්ෂික වේතනයක් හිමිවීම
(ආ) 10% ක වාර්ෂික පොලියක් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂය මත හිමිවීම
(ඉ) පිළිවෙළින් 3:2 අනුපාතයට ලාභඅලාභ බෙදා ගැනීම

ප්‍රාග්ධනය ලෙස අමිල සහ කපිල විසින් පිළිවෙළින් මුදලින් රු. 400 000 ක් සහ රු. 200 000 ක් බැගින් යොදවන ලදී. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී හවුල් ව්‍යාපාරය රු. 360 000 ක ශුද්ධ ලාභයක් ඉපැයීය.

15. 2012.03.31 දිනට අමිල සහ කපිලගේ ජංගම ගිණුම් ශේෂයන් කොපමණ ද?

| | අමිල (රු.) | කපිල (රු.) |
|---|---|---|
| (1) | 140 000 | 120 000 |
| (2) | 160 000 | 140 000 |
| (3) | 200 000 | 160 000 |
| (4) | 216 000 | 144 000 |
| (5) | 600 000 | 360 000 |

(.........)

16. අමිල සහ කපිල රු. 50 000 බැගින් වර්ෂය තුළ දී ගැතිලි ලෙස ද ලබා ගත්තේ නම්, 2012.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ හිමිකම කොපමණ වේ ද?
(1) රු. 260 000 (2) රු. 500 000 (3) රු. 600 000
(4) රු. 660 000 (5) රු. 860 000 (.........)

17. ලාභඅලාභ 2:2:1 අනුපාතයට බෙදගනිමින් අමල්, බිමල් සහ චමල් විසින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදී. 2012.03.31 දින චමල් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත් අතර අමල් සහ බිමල් ලාභඅලාභ 3:2 අනුපාතයට බෙද ගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යෑමට එකඟ වූහ. මෙදිනට, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 400 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද අතර එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගළපන ලදී. 2012.03.31 දිනට අමල් සහ බිමල්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂයන්ට මෙම කීර්තිනාම ගැළපීම කරනු ලබන ශුද්ධ බලපෑම කුමක් ද?

| | අමල් | බිමල් |
|---|---|---|
| (1) | බලපෑමක් නොමැත. | බලපෑමක් නොමැත. |
| (2) | රු. 80 000 කින් අඩු වේ. | බලපෑමක් නොමැත. |
| (3) | බලපෑමක් නොමැත. | රු. 80 000 කින් අඩු වේ. |
| (4) | රු. 160 000 කින් වැඩි වේ. | රු. 160 000 කින් වැඩි වේ. |
| (5) | රු. 240 000 කින් අඩු වේ. | රු. 160 000 කින් අඩු වේ. |

(.........)

18. 2011.04.01 දිනට සීමිත අමර පොදු සමාගමේ නිකුත් කළ සාමාන්‍ය කොටස් 500 000 ක් ද, ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු. 10 000 000 ක් ද විය. 2011.07.01 දින තිබූ සෑම කොටස් 5 කට 1 බැගින් එක් කොටසක් රු. 20 ක මිලට කොටස් නිකුත් කරමින් සමාගම රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරන ලදී. තවද 2012.01.01 දින, එදිනට පැවති සෑම කොටස් 6 කට 1 බැගින් කොටසක මිල රු. 15 ක් වූ හිමිකම් නිකුතුවක් සිදුකරන ලදී. කොටස්කරුවන් විසින් සියලු ම හිමිකම් ලබාගන්නා ලදී. මෙම ගනුදෙනු නිසා 2012.03.31 දිනට සමාගමේ හිමිකමෙහි වැඩිවීම හෝ අඩුවීම කොපමණ ද?
(1) රු. 2 000 000 කින් අඩු වේ. (2) රු. 500 000 කින් අඩු වේ.
(3) රු. 1 500 000 කින් වැඩි වේ. (4) රු. 2 000 000 කින් වැඩි වේ.
(5) රු. 3 500 000 කින් වැඩි වේ. (.........)

19. පහත සඳහන් කුමන අනුපාත අනුපිළිවෙළින් ආයතනයක **මූල්‍ය ස්ථාවරත්වය** සහ **ද්‍රවශීලතාව** මනිනු ලබයි ද?
(1) ණය - හිමිකම් අනුපාතය සහ ජංගම අනුපාතය
(2) ක්ෂණික අනුපාතය සහ ණයගැති පිරිවැටුම් අනුපාතය
(3) පොලී ආවරණ අනුපාතය සහ මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය
(4) මුළු වත්කම්වලට ප්‍රතිලාභ අනුපාතය සහ ජංගම අනුපාතය
(5) ණය අනුපාතය සහ මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය (.........)

20. ණයගැතියකු විසින් ශේෂය පියවූ විට සමාගමක ජංගම අනුපාතයට සහ ක්ෂණික අනුපාතයට ඇතිවන බලපෑම කුමක් ද?

| | ජංගම අනුපාතය | ක්ෂණික අනුපාතය |
|---|---|---|
| (1) | අඩු වේ. | අඩු වේ. |
| (2) | වැඩි වේ. | වැඩි වේ. |
| (3) | වැඩි වේ. | අඩු වේ. |
| (4) | අඩු වේ. | වැඩි වේ. |
| (5) | වෙනසක් නොවේ. | වෙනසක් නොවේ. |

(.........)



www.pastpaperlk.com www.artsapi.lk

21. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක් සම්බන්ධයෙන් පහත තොරතුරු දී ඇත.

| | රු. |
|---|---|
| ණයට විකුණුම් | 780 000 |
| ණයගැතියන්ට දුන් වට්ටම් | 65 000 |
| බොල් ණය කපා හැරීම් | 20 000 |
| ආපසු එවුම් | 35 000 |
| වර්ෂය තුළ දී ණයගැති ශේෂය අඩුවීම | 80 000 |

2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයගැතියන්ගෙන් ලද මුදල කොපමණ ද?

(1) රු. 580 000 (2) රු. 660 000 (3) රු. 695 000
(4) රු. 715 000 (5) රු. 740 000 (.........)

22. පහත සඳහන් කුමන ද ආයතනයක අසම්භාව්‍ය වගකීම් ලෙස හෙළිදරව් කෙරේ ද?

A - මූල්‍ය ආයතනයකින් ලබාගත් ණය මුදලක්
B - ආයතනයට එරෙහි නොවිසඳුනු නඩුවක්
C - වෙනත් ආයතනයක් ලබාගත් ණයක් සඳහා ඇපකරුවකු වීමට ඇතිකරගත් එකඟතාවක්
D - බැංකු ගිණුමෙහි දක්වෙන අයිරා ශේෂයක්

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි.
(4) A, B සහ D පමණි. (5) A, B සහ C පමණි. (.........)

23. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත මධුර පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012.06.30 දින අනුමත කරන ලදී. 2012.04.01 සහ 2012.06.30 අතර කාලය තුළ දී මෙම සමාගමේ පහත සඳහන් සිද්ධීන් සිදුවිය.

A - අඛණ්ඩව අලාභ ලබන ව්‍යාපාර අංශයක මෙහෙයුම් කටයුතු නතර කිරීමට සැලැස්මක් නිවේදනය කිරීම
B - ශේෂ පත්‍ර දිනට සැලකිය යුතු මුදලක් ගෙවිය යුතු ණයගැතියකු බුන්වත් වීම
C - වෙළඳපොළ අගයන් පහත වැටීම නිසා කෙටිකාලීන ආයෝජනවල අගය අඩුවීම
D - උසාවි තීන්දුවකට අනුව ශේෂ පත්‍ර දිනට හඳුනාගත යුතු වගකීමක් තිබූ බව තහවුරු වීම

ඉහත සඳහන් කුමන සිදුවීම් ශේෂ පත්‍ර දිනට ගැළපිය යුතු වේ ද?

(1) A සහ C පමණි. (2) B සහ D පමණි. (3) A, B සහ D පමණි.
(4) B, C සහ D පමණි. (5) A, B, C සහ D යන සියල්ල ම. (.........)

24. ගොඩනැගිල්ලක අපේක්ෂිත ඵලදායී ජීවකාලය සංශෝධනය කළ විට, මේ මගින් වත්කමෙහි වාර්ෂික ක්ෂයවීම්වල ඇතිවන වෙනස මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනුයේ කෙසේ ද?

(1) ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් ලෙස සලකා වර්තමාන සහ අනාගත කාලච්ඡේදවල ලාභයට හෝ අලාභයට ගළපයි.
(2) ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් ලෙස සලකා රඳවාගත් ඉපැයුම්හි ආරම්භක ශේෂය සංශෝධනය කරයි.
(3) වරදක් ලෙස සලකා රඳවාගත් ඉපැයුම්හි ආරම්භක ශේෂය සංශෝධනය කරයි.
(4) වරදක් ලෙස සලකා වර්තමාන කාලච්ඡේදයෙහි ලාභයට හෝ අලාභයට හෝ ගළපයි.
(5) ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනසක් ලෙස සලකා රඳවාගත් ඉපැයුම්හි ආරම්භක ශේෂය සංශෝධනය කරයි.

(.........)

25. 2010.03.31 දින සමාගමක් රු. 1 300 000 ක පිරිවැයකට ඉඩමක් මිල දී ගත්තේ ය. 2011.03.31 දින මෙම ඉඩම එහි සාධාරණ අගය වූ රු. 1 100 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. 2012.03.31 දින එය නැවත එහි සාධාරණ අගය වූ රු. 1 600 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. මෙම ප්‍රත්‍යාගණනයන් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනු ලබන්නේ කෙසේ ද?

| | 2011.03.31 දිනට | 2012.03.31 දිනට |
|---|---|---|
| (1) | රු. 200 000 ක අලාභයක් හඳුනා ගනී. | රු. 200 000 ක ලාභයක් හඳුනාගත් අතර ඉතිරි රු. 300 000 ප්‍රත්‍යාගණන සංචිතයක් ලෙස සලකනු ලබයි. |
| (2) | රු. 200 000 ක අලාභයක් හඳුනා ගනී. | රු. 500 000 ක ප්‍රත්‍යාගණන සංචිතයක් හඳුනා ගනී. |
| (3) | රු. 200 000 ක අලාභයක් හඳුනා ගනී. | රු. 200 000 ක ලාභයක් හඳුනා ගනී. |
| (4) | රු. 200 000 ක අලාභයක් ප්‍රත්‍යාගණන සංචිතයට කපා හරියි. | රු. 500 000 ක ප්‍රත්‍යාගණන සංචිතයක් හඳුනා ගනී. |
| (5) | රු. 200 000 ක අලාභයක් ප්‍රත්‍යාගණන සංචිතයට කපා හරියි. | රු.200 000 ක ලාභයක් හඳුනා ගන්නා අතර ඉතිරි රු. 300 000 ප්‍රත්‍යාගණන සංචිතයක් ලෙස සලකනු ලබයි. |

(.........)

26. භාණ්ඩයක නිෂ්පාදන පිරිවැය සමාන වනුයේ,

(1) ඍජු පිරිවැය සහ පොදු කාර්ය පිරිවැයෙහි එකතුවට ය.
(2) අමුද්‍රව්‍ය පිරිවැය සහ ශ්‍රම පිරිවැයෙහි එකතුවට ය.
(3) ප්‍රාථමික පිරිවැය සහ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයෙහි එකතුවට ය.
(4) ප්‍රාථමික පිරිවැය සහ නිෂ්පාදන පිරිවැයෙහි එකතුවට ය.
(5) නිෂ්පාදන පිරිවැය සහ නිෂ්පාදන නොවන පිරිවැයෙහි එකතුවට ය. (.........)



www.pastpaperlk.com www.artsaplk.lk

27. X නමැති අමුද්‍රව්‍යයෙහි කාර්තුවක ඉල්ලුම ඒකක 1 250 කි. එම ද්‍රව්‍යයෙහි ඒකකයක ගැනුම් මිල රු. 250 කි. තොග ඇණවුම් පිරිවැය ඇණවුමකට රු. 25 ක් වන අතර තොග රඳවා ගැනීමේ පිරිවැය ඒකකයක ගැනුම් මිලෙන් 10% ක් වේ. මෙම අමුද්‍රව්‍යයෙහි ආර්ථික ඇණවුම් ප්‍රමාණය,

(1) ඒකක 50 කි. (2) ඒකක 100 කි. (3) ඒකක 1 000 කි.
(4) ඒකක 2 500 කි. (5) ඒකක 5 000 කි. (.........)

28. සමාගමක් විසින් තනි භාණ්ඩයක් නිපදවා විකුණනු ලබයි. මෙම භාණ්ඩයේ ඒකකයක විකුණුම් මිල රු. 75 ක් වන අතර ඒකකයක විචල්‍ය පිරිවැය රු. 50 කි. ස්ථාවර පිරිවැය රු. 50 000 කි. සමච්ඡේද ලක්ෂ්‍ය (ඒකක) සහ විකුණුම් මට්ටම ඒකක 5 000 දී ආරක්ෂිත ආන්තිකය (රු.) පිළිවෙළින්,

(1) ඒකක 2 000 ක් සහ රු. 50 000 ක් වේ. (2) ඒකක 2 000 ක් සහ රු. 225 000 ක් වේ.
(3) ඒකක 3 000 ක් සහ රු. 75 000 ක් වේ. (4) ඒකක 3 000 ක් සහ රු. 225 000 ක් වේ.
(5) ඒකක 5 000 ක් සහ රු. 375 000 ක් වේ. (.........)

29. නිෂ්පාදන ව්‍යාපාරයක සමච්ඡේද ලක්ෂ්‍යට අදාළව පහත සඳහන් කුමන ප්‍රකාශන නිවැරදි වේ ද?

A - ලාභයක් හෝ අලාභයක් හෝ නොමැති වීම.
B - මුළු දයකය මුළු ස්ථාවර පිරිවැයට සමාන වීම.
C - විකුණුම් ආදායම මුළු පිරිවැයට සමාන වීම.
D - විකුණුම් ආදායම මුළු විචල්‍ය පිරිවැයට සමාන වීම.
E - මුළු ස්ථාවර පිරිවැය මුළු විචල්‍ය පිරිවැයට සමාන වීම.

(1) A, B සහ C පමණි. (2) A, B සහ D පමණි. (3) A, B, C සහ D පමණි.
(4) A, C, D සහ E පමණි. (5) A, B, C, D සහ E යන සියල්ල ම. (.........)

30. සමාගමක නව ව්‍යාපෘතියක මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමේ දී පහත සඳහන් කුමන අයිතම අඩංගු කෙරේ ද?

A - ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර අත්පත් කර ගැනීමේ පිරිවැය
B - එම යන්ත්‍ර ක්ෂය
C - මෙම යන්ත්‍රවල අපේක්ෂිත සුන්බුන් අගය
D - නව ව්‍යාපෘතිය නිසා දැරීමට සිදුවන මෙහෙයුම් වියදම්
E - ව්‍යාපෘතිය සම්බන්ධව වෙළඳපොළ සමීක්ෂණයක් කිරීම සඳහා දරන ලද පිරිවැය

(1) A, B සහ D පමණි. (2) A, C සහ D පමණි. (3) A, C සහ E පමණි.
(4) A, D සහ E පමණි. (5) A, B, C, D සහ E යන සියල්ලම. (.........)

● **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

31. පහත සඳහන් අංගයන්ට අදාළව මූල්‍ය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස දක්වන්න.

| අංගය | **මූල්‍ය ගිණුම්කරණය** | **කළමනාකරණ ගිණුම්කරණය** |
|---|---|---|
| (1) තොරතුරු භාවිත කරන්නන් | ..................................<br>.................................. | ..................................<br>.................................. |
| (2) තොරතුරු වාර්තා කිරීමේ වාර ගණන | ..................................<br>.................................. | ..................................<br>.................................. |

32. වර්ෂය තුළ දී තනි ව්‍යාපාරයක වත්කම් රු. 400 000 කින් ද වගකීම් රු. 50 000 කින් ද වැඩි විය. මෙම වර්ෂයේ දී ලාභය රු. 250 000 ක් නම්, අයිතිකරු විසින් හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය කොපමණ ද?

..........................................................................................................................

33. 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත මණ්ඩල **දෙකක්** සඳහන් කරන්න.

(1) .................................................... (2) ....................................................

34. පහත දක්වෙන සිදුවීම්වල දී ආයතනයක් විසින් අනුගත වන ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ගතිලක්ෂණ කවරේ ද?

| **සිදුවීම** | **ගුණාත්මක ගති ලක්ෂණය** |
|---|---|
| (අ) සෑම වර්ෂයක දී ම සරල මාර්ග ක්‍රමය මත උපකරණ ක්ෂය කරනු ලැබීම. | .................................................. |
| (ආ) මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ අත්පත්කරගත් උපකරණයක් වත්කමක් ලෙස සටහන් කිරීම. | .................................................. |



www.pastpaperlk.com
www.artsapi.lk

35. පහත දක්වෙන එක් එක් අවස්ථාවට වඩාත් සම්බන්ධ **ගිණුම්කරණ සංකල්පය** දක්වන්න.

A - සමාගමක ආදායම් ප්‍රකාශනයෙහි ආදායම් හඳුනාගනු ලබන්නේ එය ඉපයූ විට ය.

B - මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සමාගමක ජීව කාලය මාස 12 ක් බැගින් වූ කාලපරිච්ඡේදවලට බෙදා වෙන් කෙරේ.

C - සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී උද්ධමනය සඳහා ගැළපුම් කරනු නොලැබේ.

D - වගකීම් සහතික සම්බන්ධයෙන් මතුවිය හැකි ගෙවීම් සඳහා ප්‍රතිපාදනයක් සමාගමක මූල්‍ය ප්‍රකාශනවල කරනු ලැබේ.

**අයිතම** **ගිණුම්කරණ සංකල්පය**

A - ..................................................

B - ..................................................

C - ..................................................

D - ..................................................

36. ලාභ ඉපැයීමේ පරමාර්ථයෙන් තොරව පවත්වාගෙන යන ආයතනයක 'ලැබීම් සහ ගෙවීම් ගිණුම' සහ 'ආදායම් සහ වියදම් ගිණුම', ඒවා පිළියෙල කිරීමේ අරමුණ සහ පදනම යන කරුණු මත වෙන්කොට දක්වන්න.

| | **ලැබීම් සහ ගෙවීම් ගිණුම** | **ආදායම් සහ වියදම් ගිණුම** |
|---|---|---|
| අරමුණ | .............................................. | .............................................. |
| පදනම | .............................................. | .............................................. |

● **ප්‍රශ්න අංක 37 සහ 38 ට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති තොරතුරු භාවිත කරන්න.**

ආයතනයක් විසින් 2012 මාර්තු මස දී දරන ලද රු. 60 000 ක් වූ කාර්යාල වියදම්, කාර්යාල උපකරණ ගිණුමට රු. 600 000 ක් ලෙස පිටපත් කර ඇත. කාර්යාල උපකරණ වාර්ෂිකව 10% ක අනුපාතයකට පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර මෙම මාසය සඳහා ද ක්ෂය කර ඇත.

37. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභයට මෙම වැරැද්ද නිසා ඇතිවන ශුද්ධ බලපෑම කොපමණ ද?

..............................................................................................................

38. කාර්යාල උපකරණ සහ කාර්යාල වියදම් ලෙජර් ගිණුම් නිවැරදි කිරීමට ජර්නල් සටහන ලියන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

39. ගින්නක් නිසා 2012.03.31 දිනට පැවති අමල් ව්‍යාපාරයේ මුළු තොගය සම්පූර්ණයෙන් විනාශ විය. එදිනට පැවති තොරතුරු පහත දක්වේ.

| | | |
|---|---|---|
| 2011.04.01 දිනට තොගය | රු. | 200 000 |
| වර්ෂය සඳහා ගැනුම් | රු. | 1 500 000 |
| වර්ෂයේ විකුණුම් | රු. | 2 000 000 |

ව්‍යාපාරයේ විකුණුම් මත දළලාභ ආන්තිකය 20% කි.

(අ) ගින්නෙන් විනාශ වූ තොගයේ වටිනාකම කොපමණ ද?

..............................................................................................................

(ආ) රක්ෂණ සමාගමක් විසින් තොගයේ මුළු වටිනාකමෙන් 80% ක් හානිපූර්ණය කිරීමට එකඟ වී ඇත්නම්, 2012.03.31 දිනට සමාගමේ මුළු වත්කම්වලට ඇති වන ශුද්ධ බලපෑම කොපමණ ද?

..............................................................................................................

● **ප්‍රශ්න අංක 40 සහ 41 ට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති තොරතුරු භාවිත කරන්න.**

නිෂ්පාදන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් 2012 පෙබරවාරි මස සඳහා පහත සඳහන් තොරතුරු දී ඇත.

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් | 300 000 |
| සෘජු ශ්‍රමය | 170 000 |
| සෘජු වියදම් | 30 000 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 300 000 |

| තොගය: | 2012.02.29 (රු.) | 2012.01.31 (රු.) |
|---|---|---|
| අමුද්‍රව්‍ය | 50 000 | 100 000 |
| නොනිමි ද්‍රව්‍ය | 150 000 | 100 000 |
| නිමි භාණ්ඩ | 100 000 | 180 000 |

- නොනිමි ද්‍රව්‍ය තොගය නිෂ්පාදන පිරිවැයට ගළපන බව උපකල්පනය කරන්න.
- නිෂ්පාදිත අයිතම විකුණුම් පිරිවැය මත 25% ක ලාභ ආන්තිකයක් පවත්වා ගනිමින් විකුණනු ලැබේ.

40. 2012 පෙබරවාරි මාසය සඳහා ප්‍රාථමික පිරිවැය සහ නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

(අ) ප්‍රාථමික පිරිවැය :.................................... (ආ) නිෂ්පාදන පිරිවැය :....................................

41. මෙම මාසය තුළ දී උපයන ලද දළ ලාභය කොපමණ ද?

....................................................................................................

● **ප්‍රශ්න අංක 42 සහ 43 ට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති තොරතුරු භාවිත කරන්න.**

2012.03.31 සහ 2011.03.31 දිනවලට සීමිත සුමුදු පොදු සමාගමේ යන්ත්‍රසූත්‍ර සම්බන්ධ ශේෂපත්‍ර උද්ධෘතයන් පහත දී ඇත.

| | 2012.03.31 (රු.'000) | 2011.03.31 (රු.'000) |
|---|---|---|
| යන්ත්‍රසූත්‍ර - පිරිවැයට | 1 500 | 1 000 |
| සමුච්චිත ක්ෂය | 500 | 400 |

**අතිරේක තොරතුරු:**

2012.03.31 දින සමාගම විසින් පිරිවැය රු. 300 000 ක් වූ යන්ත්‍රයක් රු. 160 000 කට විකුණන ලදී. මෙදිනට යන්ත්‍රයේ ධාරණ වටිනාකම රු. 200 000 ක් විය. මෙදිනම නව යන්ත්‍රයක් මුදලට අත්පත් කරගන්නා ලදී.

42. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රසූත්‍රවලට අදාළව ආයෝජන කටයුතුවලින් ඇති වූ මුදල් ප්‍රවාහ ගලාඒම් සහ ගලායෑම් දක්වන්න.

(අ) මුදල් ප්‍රවාහ ගලාඒම් ....................................

(ආ) මුදල් ප්‍රවාහ ගලායෑම් ....................................

43. ඉහත ගනුදෙනුවලින් පැනනගින මුදල්-නොවන අයිතමයක් (වටිනාකම ද සහිතව) දක්වන්න.

....................................................................................................

44. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී සමාගමක මෙහෙයුම් කටයුතු නිසා එහි වැඩබිම (ඉඩම) අපවිත්‍ර වූ අතර මේ ප්‍රදේශයේ පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් මෙම ඉඩම පවිත්‍ර කළ යුතු යැයි නියෝග කරන ලදී. මේ සඳහා සමාගමට සැලකිය යුතු මුදලක් දැරීමට සිදු වේ. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම විසින් මේ සඳහා ප්‍රතිපාදනයක් කළ යුතු ද යන්න කරුණු සහිතව දක්වන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

45. සපත්තු නිෂ්පාදන ආයතනයකට අදාළව පහත දක්වෙන එක් එක් පිරිවැය අයිතමය **සෘජු** හෝ **වක්‍ර** ලෙස වර්ගකරන්න.

(අ) පදම්කළ සම් පිරිවැය ....................................

(ආ) කම්හල් කළමනාකරුගේ වැටුප් ....................................

(ඇ) යන්ත්‍ර මෙහෙයුම්කරුවන්ගේ වේතන ....................................

(ඊ) යන්ත්‍ර ක්ෂය ....................................



www.pastpaperlk.com www.artsapi.lk

46. සමාගමක නිෂ්පාදන මට්ටම් දෙකක දී පිරිවැය දත්ත පහත දී ඇත.

| පිරිවැය අයිතම | ඒකක 10 000(රු.) | ඒකක 20 000 (රු.) |
|---|---|---|
| සෘජු ශ්‍රමය | 30 000 | 60 000 |
| විදුලිය | 10 000 | 15 000 |
| කම්හල් කුලී | 15 000 | 15 000 |

මෙම එක් එක් පිරිවැය අයිතම ස්ථාවර, විචල්‍ය හෝ අර්ධ විචල්‍ය හෝ ලෙස වර්ග කරන්න.

**පිරිවැය අයිතමය** **වර්ගීකරණය**

(අ) සෘජු ශ්‍රමය : ..........................................................

(ආ) විදුලිය : ..........................................................

(ඉ) කම්හල් කුලී : ..........................................................

● **ප්‍රශ්න අංක 47 සහ 48 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් තනි භාණ්ඩයක් මිල දී ගෙන විකුණනු ලබයි. විකුණුම් මිල ඒකකයක් සඳහා රු. 250 කි. 2012.07.01 දින ආරම්භක තොගයේ ඒකකයක් රු. 150 බැගින් වූ ඒකක 100 ක් විය. 2012.07.10 දින සමාගම ඒකකයක් රු. 200 බැගින් ඒකක 150 ක් මිල දී ගන්නා ලදී. 2012.07.31 දින සමාගම විසින් ඒකක 200 ක් විකුණන ලදී.

47. තොග තිකුත් කිරීමේ දී පෙර - ඇතුළු - පෙර - පිට (FIFO) මිල කිරීමේ ක්‍රමය භාවිත කරන්නේ නම්, පහත ද දක්වන්න.

(අ) 2012 ජුලි මාසය සඳහා විකුණුම් පිරිවැය: ..........................................................

(ආ) 2012.07.31 දිනට තොගයේ වටිනාකම: ..........................................................

48. තොග නිකුත් කිරීමේ දී බර තැබූ සාමාන්‍ය මිල ක්‍රමය භාවිත කරන්නේ නම් 2012 ජුලි මාසය සඳහා දළ ලාභය කොපමණ ද?

..........................................................................................................

49. සමාගමක් විසින් නිෂ්පාදනය කරනු ලබන තනි භාණ්ඩයක් සම්බන්ධව අයවැයගත ආදායම් සහ පිරිවැය දත්ත පහත දී ඇත. විකුණුම් පරිමාව ඒකක 20 000; ඒකකයක විකුණුම් මිල - රු. 20; දායක විකුණුම් අනුපාතය - 40%; ස්ථාවර පිරිවැය - රු. 100 000.

**ගණනය කරන්න:**

(අ) සමච්ඡේද ලක්ෂ්‍ය (ඒකක) ..........................................................

(ආ) අයවැයගත විකුණුම් පරිමාවේ දී ලාභය ..........................................................

50. අනිකුත් සාධක නොවෙනස්ව පවතියයි උපකල්පනය කර පහත සඳහන් එක් එක් අයිතමය ආයෝජන ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය **වැඩි** කරයි ද **අඩු** කරයි ද යන්න දක්වන්න.

(අ) අපේක්ෂිත මුදල් ප්‍රවාහ ගලාඒමේ වැඩි වීමක් ..........................................................

(ආ) වට්ටම් අනුපාතයේ වැඩිවීමක් ..........................................................

(ඉ) ආරම්භක ආයෝජනයේ අඩුවීමක් ..........................................................

(ඊ) වත්කම්වල සුන්බුන් අගයේ අඩුවීමක් ..........................................................

* * *

www.pastpaperlk.com www.artsapi.lk